විෂයමාලා න්‍යාය හා භාවිතය -
දේශනය - (02)
විමලසේන සර් - 2021. 9. 26
**(12.30 – 3.30)**

# විෂය මාලාවේ දාර්ශනික පදනම



<u>විෂය අන්තර්ගතය</u> :

I. දර්ශනය යනු කුමක්ද?
II. විෂය මාලාව හා දර්ශනය අතර සම්බන්ධතාවය
III. විෂය මාලාවේ පවතින ප්‍රධාන දර්ශන
   - විඥානවාදය
   - යථාවාදය
   - උපයෝගීතාවාදය
   - සාංදෘෂ්ටිකවාදය

# දර්ශනය හා විශය මාලාව

## අධ්‍යාපන දර්ශනය

දර්ශනයෙහි එක් කොටසක් වන අධ්‍යාපනය පිළිබඳව ඉගෙන ගැනීමේදී අධ්‍යාපනය යනු කුමක්ද? අධ්‍යාපනයේ අරමුණ කුමක්ද? අධ්‍යාපනය හා සමාජය අතර සම්බන්ධතාවය කුමක්ද? යන ප්‍රශ්න සාකච්ඡා කිරීමට වටී. මෙහි නිවැරදිව හඳුනාගැනීමට නම් වගකීම් සහගත තාර්කිකව සිතා මතා කටයුතු කරන සමාජ ප්‍රජාවගේ හා අභියෝගාත්මක කාර්යයන් ගැන යොමු විය යුතුය.

පසුගිය වර්ෂ 2000 කාලය තුළ හමුවූ සුවිශේෂී දර්ශන වාදීන්ගෙන් බොහොමයක්ම අධ්‍යාපනය පිළිබඳව දර්ශනයන් ඉදිරිපත් කර ඇත. යම් යම් අවස්ථා වලදී ඔවුන්ගේ අධ්‍යාපනය පිළිබඳ දර්ශනයන් යාන්තමින් කරුණු සලකා බලා ඒ පිළිබඳව සාපේක්ෂව අදහස් දක්වා ඇත. එය හුදෙක්ම අධ්‍යාපන දර්ශනය නොවේ. **ප්ලේටෝ, ඇරිස්ටෝටල්, ජෝන් ඩුවී, රූසෝ** හා **කොන්ෆියුසස්** යන දාර්ශනිකයන් අධ්‍යාපනය ගැන වඩාත් හොඳින් අවධාරණය කර ඇත. ඔවුන් අධ්‍යාපනයට සම්බන්ධව වඩාත් තාර්කිකව වඩාත් ශක්තිමත් මානයන් (දර්ශකයන්/ නිදර්ශනයන්) ඇසුරින් අදහස් දක්වා ඇත. එම කරුණු බොහෝ සාරගර්භය. ඒවා අධ්‍යාපනයට සම්බන්ධ පවත්නා ගැටළු, මතවාද මනා ලෙස විග්‍රහ කරමින් ඉදිරිපත් කර අධ්‍යාපන දර්ශනයට අනුකූල අදහස් වේ. එබැවින් එය ඉතා සුවිශේෂී කොට සැලකිය හැක.

## අධ්‍යාපන දර්ශනය හා විෂය මාලාව අතර සම්බන්ධතාවය

දර්ශනය යන්න කෙටියෙන් අර්ථ දක්වන්නේ නම් 'යහපත් දැක්ම/ප්‍රඥාව' යි. ඒ අනුව ගුරුවරයාට යහපත් දැක්මක් තිබිය යුතු අතර ඒ තුළින් පන්ති කාමරය තුළ මනාව සංවිධානය වූ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියක් ගොඩනැංවිය හැක. විෂය මාලාවක් යන්න කෙටියෙන් දක්වන්නේ නම්, මූලික වශයෙන්ම ප්‍රජානන, ආවේදන හා මනෝචාලක අරමුණු පවතින්නා වූ විෂයන් සංකලනය වූ පද්ධතියකි. ඒ අනුව ඕනෑම විෂය මාලාවක්, පාඨමාලාවක් සකස් වන්නේ දර්ශනය පදනම් කරගෙනය. තවද සමාජ විද්‍යාත්මක පසුබිම, සමාජයේ දාර්ශනික පසුබිම යනාදිය විශේෂයෙන්ම විෂයමාලාවක් සැදීමේදී බලපානු ලැබේ. මේ නිසා විෂය මාලාව හා දර්ශනය අතර පැහැදිළි සම්බන්ධතාවයක් පවතී.

අධ්‍යාපන දර්ශනය හා විෂය මාලාව අතර ඇති සම්බන්ධය කුමක්ද යන්න සලකා බැලිය යුතුය. මූලික වශයෙන් දර්ශනය ඕනෑම විෂයක්, පාඨමාලාවක් ලබා දීමේදී එහි මූලිකවම අඩංගු විය යුතු වන්නේ දර්ශනය බව පෙන්වා දෙයි. උදාහරණයක් වශයෙන්

ඕනෑම විෂය මාලාවක් සකස් කිරීමේ පදනම ලෙස යොදා ගන්නේ දර්ශනයයි. විෂය මාලාවේ පදනම වන්නේද දර්ශනයයි. පංති කාමර වල ඉදිරිපත් කරනු ලබන ඉගෙනුම් - ඉගැන්වීම්, අරමුණු, පරමාර්ථ තෝරා ගැනීම ප්‍රධාන නිර්ණායක වන්නේ අධ්‍යාපන දර්ශනයයි. උදාහරණයක් වශයෙන් පහත කරුණු සලකා බලමු.

- පාසල් පද්ධතිය කුමටද?
- වැඩි වටිනාකමක් ඇත්තේ කුමන විෂය ධාරාවද?
- ශිෂ්‍ය පාඨමාලා වල අඩංගු විය යුතු කරුණු මොනවාද? කරුණු උගන්වන්නේ කෙසේද? පෙලපොත් පාවිච්චි කිරීම, ගෙදර වැඩ තීරණය කිරීම ආදී කරුණු සඳහා මෙම දාර්ශනික පැත්ත සලකා බලනු ලබයි. ඒ සඳහා දාර්ශනික පදනම මූලිකව සලකා බලයි.

නූතන යුගයේ, අධ්‍යාපනය ප්‍රායෝගිකව ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳව විවිධ මත පවතී. දරුවන් ජීවිතය හා සම්බන්ධව ඉගෙන ගත යුත්තේ කුමක්ද යන්න ආදී පොදු එකඟතාවයක් නොපවතී. කුමක් කෙසේ ඉගෙන ගත යුතුද? එලෙසම අධ්‍යාපනයේ වඩාත්ම ඉලක්ක ගත යුත්තේ කුමක්ද?, උගත්කම කෙරේද? නැතිනම් අධ්‍යාත්මික චරිත කෙරේද යන්න පැහැදිළි අදහසක් නොපවතී. මෙහිදී විෂය මාලාව දර්ශනය වන අතර දැක්මක් ඇති බව පැහැදිළි වේ.

## විෂය මාලාවේ පවතින ප්‍රධාන දර්ශන

### විඥානවාදය - IDEALISM

විඥානවාදී දර්ශනය ගුරු කුළයක් වන අතර මෙම දර්ශනය අවධාරණය කරන්නේ ග්‍රීක දාර්ශනිකයන්ය. ඒ අතරින් **සොක්‍රටිස්, ප්ලේටෝ, හේගල්** ප්‍රමුඛතාවය ගනී. තවද **සොක්‍රටීස්** හා **ජර්මන් ජාතික හේගල්** මෙම මතය ඉදිරිපත් කරයි. මෙම දර්ශනවාදය තුළ පොදු හරය වන්නේ සාරධර්ම හා ආචාරධර්ම පද්ධතිය පිළිබඳව විවරණ සැපයීමකි. බුදු දහම අනුවද විඥානවාදය මනසේ නිර්මාණයක් බව කියැවේ. විශ්වාසය හා සත්වයා මායාවක් බව, සත්‍යමය හෝ පැවැත්මක් නැති බව, විඥානයන් හා මනස භෞතික ලෝකයේ මූලාරම්භය බව විශ්වාස කරන අතර මෙම මූලධර්ම වලට අනුකූලව ලෝකයේ පැවැත්ම පැහැදිළි කරයි. මෙය බටහිර දර්ශනයේදී පාරභෞතික, අධිභෞතික වාදය ලෙසද විග්‍රහ කර ඇත. එහෙත් බුදු දහමේ විඥානය සහ බටහිර විඥානය එකට ගෙන සාකච්ඡා කළ නොහැක.

මෙම දර්ශනය අනුව සත්‍ය වෙනස් නොවන සුලු අකාලික විශ්වයීය ස්වභාවයෙන් සහිතය. එහිදී උපකල්පිත ලෝකය පොදුය. එහෙත් අනුක්‍රමික දැනුම උත්පාදනය සඳහා පුනර් චින්තනය තුළ සැගවී ඇති දෑ මතුකර ගත යුතු බව පෙන්වා දෙයි. මෙම දර්ශනය මඟින් මිනිස් සිත, පූර්ණ වර්ධනයක් සඳහා මතුකර ගැනීමට ඒ සඳහා ප්‍රමුඛත්වය ලබාදෙයි. සෑම යථාර්ථයක්ම අපේක්ෂිත කර ගැනීමට නම්, සිත දියුණු කර ගත යුතු බව පෙන්වා දෙයි.

තවද ලෝකය නිරතුරුවම වෙනස් වන බැවින් බාහිර ලෝකයේ ස්වභාවය, පිරික්සීමෙන් සත්‍ය සොයාගත හැකි බව පෙන්වා දෙයි. ඒ සඳහා මනසින් ගොඩනගන ලද පරමාදර්ශ (IDIAL) සත්‍ය සෙවීමට උපකාරී වන බව පෙන්වා දෙයි. එසේම දෙදෙනෙකුගේ අදහස් දෙයාකාර, දැක්මක් ඇති බැවින් එය ඒකාකාර දැක්මක් බවට පත්කර ගත යුතුය. ඒ සඳහා පිවිසුම ලෙස සාකච්ඡාව යොදාගත යුතු බව පෙන්වා දෙයි. මෙම දර්ශනවාදය අනුව මිනිස් සිත ආධ්‍යාත්මිකයි. මෙහිදී භෞතික දේවල් උසස් නොවේ. සිත ප්‍රධාන මූලිකයා වේ. ලෝකයේ භෞතික දේවල් පාලනය කරන්නේ සිතයි. මේ නිසා මෙම දර්ශනය මඟින් උසස් මානසික තත්වයක් කරා යොමුවන සංකල්ප වලට මුල්තැන දෙයි.

## විඥානවාදය හා විෂය මාලාව අතර සම්බන්ධය

විඥානවාදය සහ විෂය මාලාව අතර අන්තර් සම්බන්ධතාවයක් පවතී. මෙම දර්ශනය තුළින් වැඩි වශයෙන් අවධාරණය කරන්නේ ආචාර ධර්මයි. එබැවින් සාරධර්ම හා ආචාර ධර්ම පදනම් කරගත් අධ්‍යාපනයක් ලබා දීම යෝග්‍ය වේ. පවතින තත්වයට වඩා මානසික වැදගත්කම උසස් කොට සලකන බැවින් ආධ්‍යාත්මය මුල්කරගත් විෂය මාලාව වැදගත් කොට සැලකිය හැක. අධ්‍යාපන සංකල්පය හා බැඳුණු ක්‍රියාවලියක් ලෙස සකස් විය යුතුය. ආධ්‍යාත්මික ගුණ වගාවට උචිත විෂය මාලා ලබා දීම යෝග්‍ය වේ. එබැවින් විෂය මාලාව සම්පාදනයේදී මෙම අදහස් මුල්කොට සැලකිය යුතුය. එසේම මෙම දර්ශනවාදය අනුව ගතික සම්බන්ධ සංස්කාරක සම්බන්ධතා සහ මානව සම්බන්ධතා වැදගත් වේ.

ඒ සඳහා සාහිත්‍ය, ආගම, භාෂාව, වැනි විෂයන් මූලික විෂය මාලාවට එකතු කර ඉගැන්විය යුතුය. තව දුරටත් සදහන් කළහොත් පුද්ගලයා හා පුරවැසිභාවය පරිපූර්ණත්වය ලඟා කරගැනීම සඳහා යුක්ති සහගත පාලනයක් ලබා දෙන අධ්‍යාපනයක් ලෙස විෂය මාලාව සැපයිය යුතු බව පෙන්වා දෙයි. ඒ අනුව විඥානවාදී විෂය මාලාව තුළ පහත කරුණු අවධාරණය කරයි.

- පුද්ගල අදහස් හා පෞද්ගලික අවශ්‍යතා හඳුනා ගැනීම
- දැනුම ගවේෂණයට උදව් කිරීම

- සමාජයට අවශ්‍ය පුද්ගලයෙකු ලෙස සකස් කිරීම

ආදී කරුණු අඩංගු විය යුතුය. තවද පෞරුෂ වර්ධනයක් සඳහා උචිත ක්‍රමවේදයක් ගොඩ නැංවිය යුතු බව පෙන්වා දෙයි. සමස්තයක් ලෙස පොදුවේ මෙම කරුණු පැහැදිළි කල හැක.

I. විෂය මාලාව පොදු විය යුතුය
II. වයස, ලැදියා රුචිකත්වයන්ට අනුකූල විය යුතුය
III. යාවජීව අධ්‍යාපනයක් ලබාදීම වැදගත් වේ.

## උපයෝගීතාවාදය - PARAGMATISM

උපයෝගීතාවාදී දර්ශන ගුරු කුලය සාම්ප්‍රදායික දර්ශනයට හාත්පසින්ම වෙනස් මඟක් ගන්නා අතර මෙමඟින් අවධාරණය කරන්නේ වෙනත් දාර්ශනික අදහසක්ය. මෙහි යථාර්ථය මතු වන්නේ පරිසරය හා පලපුරුද්ද මත අන්තර් ක්‍රියාකාරීත්වය තුළින් මතුවන දෙය දැනුම බව පෙන්වා දෙයි. එම මතුවන දෙය සැබෑ යථාර්ථය බව මෙම ගුරු කුලයේ දාර්ශනිකයන් පෙන්වා දෙයි.

මෙම දර්ශනවාදයෙහි මූලිකයන් වන්නේ **පියර්ස්, ජෝන් ඩුවී, බේකන්, ජෝන් ලොක්, රූසෝ** යන අයයි. මෙමගින් අවධාරණය වන්නේ සත්‍ය සෙවීම සඳහා පර්යේෂණාත්මක ප්‍රවේෂයකි. මෙම දර්ශනයේ පදනම වන්නේ සියලු දේ වෙනස්වන සුලු අතර සෑම සත්‍යයක්ම පවත්නා ස්වභාවයට සාපේක්ෂ වන බැවින් ක්‍රියාවලියක් තුළින් මතුකර ගත යුත්තක් බවයි. එනම් වෙනස් වන නිත්‍ය ලෝකයක, වෙනස් නොවන පරමාර්ථ තබා ගත නොහැක. මේ නිසා දැනුම ගොඩ නැගෙන්නේ කිසියම් ක්‍රියාවලියක ප්‍රතිඵලයක් ලෙස බව පෙන්වා දෙයි. සත්‍ය යන්න එක් එක් පුද්ගලයාගෙන් පුද්ගලයාට වෙනස්වන නිසා සැමවිටම සත්‍ය කේවල සත්‍යයක් නැතැයි උපයෝගීතාවාදීන් කියයි.

## <u>උපයෝගීතාවාදය හා විෂය මාලාව අතර සම්බන්ධය</u>

උපයෝගීතාවාදීන්ට අනුව අධ්‍යාපන අරමුණු ක්‍රියාවලියට සරිලන පරිදි වෙනස් වන නිසා විෂය මාලාව ඒ ඒ අවස්ථා වලට ගැලපෙන පරිදි නවීකරණය වන විෂය මාලාවක් තිබිය යුතුය. ලැදියා සහ හැකියා වලට ගැලපෙන කාලීන විෂය මාලාවක් ඇතුලු කළ යුතුය. ඒ අනුව පහත කරුණු වලට උචිත විෂය මාලාවක් යෝග්‍ය වන බව පෙන්වා දිය හැක.

- ශිෂ්‍ය කැමැත්ත මත විෂයන් තේරීම
- ස්වභාව අධ්‍යනයට ඉඩදීම

- ♣ ආකෘති හා ක්‍රියාකාරකම් මගින් අවස්ථා සම්පාදනය කිරීම
- ♣ තවද විෂය මාලාවට ඇතුළත් වන සියලු කරුණු, විෂයන්, දෙමාපියන්, සමාජීය, ශිෂ්‍යයන් ආදි වශයෙන් හැඩගස්වන්නක් විය යුතුය.
- ♣ එමෙන්ම ගැටලු විසඳීම සජීවි අත්දැකීම් ඇසුරින් ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය යොමු කිරීමට සාර්ථක ප්‍රායෝගික වැඩ සහිත විෂය මාලාවක අවශ්‍යතාවයක් ඇතිබව පෙනීයයි. උපයෝගීතාවාදීන්ට අනුව අත්දැකීම් ඉතා වැදගත් වන අතර පුද්ගල අත්දැකීම් ඉතා වැදගත් සාධකයකන් වන අතර වර්තමානයට මෙන්ම අනාගතයට රුකුලක් වන බව පෙන්වා දෙයි. තවද උපයෝගීතාවාදීන්ට අනුව වඩාත් සුදුසු වන්නේ ශිෂ්‍ය කේන්ද්‍රීය විෂය මාලාවක් බව පෙනේ. එහිදී අධ්‍යාපනය තුළින් ජීවිත ගැටලු, අභියෝග වලට මුහුණ දීම, සමාජ බලවේග වලට සුදුසු පුද්ගලයන් බිහි කිරීම සඳහා වූ යෝග්‍ය විෂය මාලාවක් සුදුසු බව පෙන්වාදිය හැක.

## යථාවාදය - REALISM

මෙම ගුරු කුලයේ ප්‍රධානතම ඉගැන්වීම වන්නේ සැබෑ සත්‍ය ලෙස ද්‍රව්‍යාත්මක ලෝකයයි (භෞතික ලෝකය) . එනම් ලෝක සත්‍ය සම්බන්ධ කරන්නේ මනසට නොව ද්‍රව්‍යයටයි. එහිදී පුද්ගල ඥානය යනු ද්‍රව්‍යාත්මක ලෝකයයි. එය පුද්ගලයාගේ ස්වභාවයට අනුකූලව වර්ධනය පිළිබඳව අවධාරණය කරයි. එසේ නැතිනම් ස්වභාවික ජීවිතය මුලුකර ගනී. එහිදී මූලික තැන ගන්නේ ද්‍රව්‍යයයි. එහිදී සිත දෙවැනි කොට සලකයි. සෑම නිර්මාණයක්ම එසේත් නැතිනම් සෑම දෙයක්ම ස්වභාව ධර්මය ලබා දී ඇති බව ඔවුන්ගේ දර්ශනයයි.

එයට ආවේනික සමාජ ධර්මතා, නියමයන් ඔවුන් මෙම දර්ශනය තුළින් උගන්වයි. මෙනිසා දැනුම යන්නෙහි අදහස වන්නේ ස්වභාව ධර්මය අධ්‍යයනය කිරීමයි. කෙනෙකු දැනුම සොයා යනවානම් ස්වභාව ධර්මය අධ්‍යනය කළ යුතු බව මෙම දර්ශනවාදීන් පෙන්වා දේ. එහිදී ලෝක ස්වභාවය අධ්‍යයනය කිරීම දැනුම සෙවීමේ මූලාරම්භය වේ. එමෙන්ම දැනුම ගොඩ නැගෙන්නේද ස්වභාව ධර්මය හේතුවෙන් බව ඔවුන්ගේ දර්ශනයෙන් පැහැදිළි කරයි.

## යථාවාදය හා විෂය මාලාව අතර සම්බන්ධය

මෙම මතය අනුව දැනුම විෂය බද්ධයි. එනම් සැබෑ දැනුම ස්වභාවික ලෝකයත් සමඟ සම්බන්ධ වීමෙන් සොයා ගත යුතුය. මෙම දර්ශනය අනුව අධ්‍යාපනයේ මූලික අරමුණ වන්නේ ළමයා සදාචාර පුද්ගලයෙකු ලෙස බිහි කිරීමයි. එබැවින් පුද්ගලයාට දැනුම ස්වභාවික ලෝකයත් සමඟ හුවමාරු කරගන්නට සිදුවේ. ඒ තුළින් සදාචාරාත්මක පදනම මත විෂය මාලාවක් සකස් විය යුතු බව පෙනීයයි. එමෙන්ම ස්වභාව ධර්මයට අනුකූලව ලබන දැනුම ඉතා වටිනා බව පෙන්වා දෙයි. එම දර්ශනය අනුව විෂය මාලාව පහත පරිදි විය යුතු බව අවධාරණය කරයි.

- ♣ ක්‍රියාකාරකම් පදනම් කරගත් විෂය මාලාවක් වීම.
- ♣ ළමුන්ගේ විෂය මාලාව ස්වභාවධර්ම මතවලට පදනම් වන විෂයමාලාවක් වීම.
- ♣ පරිසරයට අනුකූල අධ්‍යාපනයක් ලබා දීම, විෂයන් ක්‍රියාකාරකම් වලට බඳුන් කරවීම.
- ♣ සදාචාරාත්මක පදනම එම ස්වභාව ධර්මය තුළින් අධ්‍යාපනය ලබා දීමේ වැදගත්කම අවධාරණය කරයි.
- ♣ එමෙන්ම ළමයාට ඍජු අත්දැකීම් ලැබිය හැකි ඉගෙනුම් - ඉගැන්වීම් වාතාවරණයක් සැලසුම් කිරීම.
- ♣ ළමයාට ලෝකය දැන ගැනීමට අවශ්‍ය විෂය සංකලනයක් ලබා දීම. එනම් තාරකා විද්‍යාව, භූගෝල විද්‍යාව වැනි විෂයන් ඉගැන්වීම.
- ♣ ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය ශිෂ්‍ය කේන්ද්‍රීය වීම. මේ ආකාරයේ විෂය මාලාවක් අනුමත කිරීම උචිත බව පෙන්වා දිය හැක.

ඇගයීම :

**I. දර්ශනය යන්නෙන් ඔබ අදහස් කරන්නේ කුමක්ද?**

**II. දර්ශනය හා විෂය මාලාව අතර සම්බන්ධතාවය ඔබේ අදහස් වලින් ලියන්න.**

**III. විඥානවාදය, උපයෝගීතාවය හා යථාවාදය කෙටියෙන් පැහැදිළි කරන්න.**

**IV. පොදුවේ විෂය මාලාව හා දාර්ශනික ගුරුකුල අතර සම්බන්ධතාවය පැහැදිළි කරන්න.**

# සාංදෘෂ්ටිකවාදය - EXISTENILISM

සාන්දෘෂ්ටිකවාදය යනුවෙන් හඳුන්වනු ලබන්නේ මිනිසාගේ පැවැත්ම තේමාව කොටගෙන මිනිස් ජීවිතයේ වටිනාකම ජීවිතයේ අර්ථය සොයා ගිය දාර්ශනිකවාදයකි. මෙය ලතින් වචනයෙන් නැඟී සිටීම, සතු වීම වැනි අදහසක් ගෙනදේ. ඉංග්‍රීසි වචනයේ අදහස පැවැත්ම යන්නයි. මෙය මිනිසාගේ පැවැත්ම පිළිබඳ වාදයකි. සාන්දෘෂ්ටිකවාදයේ හරය මිනිසාගේ ජීවිතයේ පැවැත්ම පිළිබඳවය.

සාන්දෘෂ්ටිකවාදයට අනුව ජීවිතය හා ජීවත්වීම ප්‍රධාන වේ. සාම්ප්‍රදායික දාර්ශනිකයන් සිත්යොමු කළේ ලොව සියලු වස්තුන්වල සාරය පිළිබඳව වන අතර සාන්දෘෂ්ටිකවාදීන් සාරයට පැවැත්ම වැදගත් බව කියා සිටියේය. මෙහි අදහස අනුව යහපත් දැක්මක් සහිත මතය යන තේරුමට ළඟා විය හැකි බව පෙනීයයි.

මෙම දර්ශනය ඉදිරිපත් කරන දාර්ශනිකයන්ගේ අදහස වන්නේ මිනිසා මිනිසෙකු වශයෙන් නැඟී සිටිය යුතු බවයි. ඇතැම්විට රළු, පක්ෂපාතී, විප්ලවකාරී, ප්‍රචන්ඩකාරී හෝ භයානක ලෙස පෙනී ගියද එහි අඩංගු මිනිස් ජීවිතයට පක්ෂපාතීව හෙලන ලද චින්තනය සංදෘශ්ටිකවාදයේ මූලධර්මය විය. මෙම දර්ශනය ගොඩනැංවීමට දායක වූ දාර්ශනිකයන් අතර ජර්මන් ජාතික ජෙස්රික් නිට්ෂේ, කාල් ජැකැස්, ග්‍රේට්සල්, මිෂල් යන අය දැක්විය හැක.

මෙම දර්ශනයට අනුව ලෞකික ජීවිතය නිස්සාරණ බවත් සැපත පසුපස හඹායන බවත් එහි ප්‍රතිඵලය නම් කැරට් අලය පසුපස හබා යන අශ්වයා මෙන් වෙහෙසට, පීඩාවට, කලකිරීමට පත්වන බවයි. යමක් සැපතක් ලෙස පෙනෙන්නේ එහි ළඟාවනතුරු පමණක් බවත්, එය අත්පත් කරගත් පසු එය මිරිගුවක් සේ දිවන බවත් පැවසීය. මෙය වර්ධනය කර ගැනීමට නම් ඔවුන් පවසන්නේ ආදරය, දයාව, කරුණාව, මානව භක්තිය වැනි ගුණාංග මිනිසා විසින් පලා ගොස් ඇති අතර, ගිලිහී ගොස් ඇති අතර එය සැවොම එක්වී මිනිසෙකු ලෙස මානුෂික සම්බන්ධතා ගොඩනගාගෙන ජීවිතය පවත්වා ගෙන යෑමයි. එසේ කිරීම තුළින් මිනිස් ජීවිතයට වටිනාකමක් ආරෝපණය වේ. තව දුරටත් පෙන්වා දෙන පරිදි මිනිසාට තමා විසින් තමා ගැන සිතා අනාගතය වෙනස් කළ හැක්කේ මිනිසාට පමණි.

## සාංදෘෂ්ටිකවාදය හා විෂය මාලාව අතර සම්බන්ධය

මෙම දර්ශනය අනුව ආධ්‍යාත්මය ඉතා වැදගත් කොට සලකයි. ආකල්ප වර්ධනය ඉතා වැදගත් වේ. සදාචාරය, සහයෝගී බව වැනි ගුණාංග ඉස්මතු වන අධ්‍යාපනයක් යෝජනා කරයි. මෙම දර්ශනවාදයට අනුව චරිත සංවර්ධනය ගැන අදහස් දක්වයි. චරිතය සංවර්ධනය උදෙසා විෂය මාලාව ක්‍රියාත්මක වීමේ වැදගත්කම අවධාරණය කරයි.

කියවීම, දැනීම, ප්‍රීතිය යන ගුණාංග වැඩෙන ඉගෙනුම්- ඉගැන්වීම් ක්‍රියාවලියක් උපයෝගී විය යුතුය. මානසික සත්භාවය, නිවහල්භාවය ඇතිවන දෘෂ්ටියක් ළමයින් තුළ ඇතිකළ යුතු බව පැහැදිළි කරයි.

එමෙන්ම ශිෂ්‍ය කේන්ද්‍රිය අධ්‍යාපනයක් ලබාදීම, ඒ සඳහා උචිත විෂයමාලා සම්පාදනය වැදගත් බව අවධාරණය කරයි. අධ්‍යාපනය ලැබීම තුළින් නිවහල් ස්වාධීන පුද්ගලයෙකු නිදහසේ සිතීමට ඉඩකඩ ඇති පරිසරයක් පෙන්වා දිය යුතු බව පැහැදීළි කරයි. සමස්ථයක් වශයෙන් ගත්විට හදවතට සමීප මානව දයාව පෙරටු කරගත් විෂයමාලා ඉගැන්වීම් තුළින් අර්ථවත් ජීවිතයක් ගොඩනගා ගැනීමට හැකියාව ඇති බව පෙන්වා දිය හැක.